**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - 2021**

**------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මතය වියාචනය

-------------------

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර්31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හේතුවෙන් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

-----------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මඟින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරියේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 ප්‍රකාරව, ආයෝජන දේපලවලට අදාලව සාධාරණ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වෙන්ව දැක්විය යුතුවුවද, යාල සංචාරක සංවර්ධන කලාපයට අයත් බදු දුන් ඉඩම් අක්කර 35 කට අදාලව සාධාරණ අගය වූ රු. 280,000,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 2022 ගිණුම් වර්ෂය තුල නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූල විය යුතු බව. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එක් එක් පළාත් සභා විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන් වෙනුවෙන් ලබාදුන් මුදලින් රු.6,496,096 ක්, වියදම් දරන ලද වර්ෂ අනුව හඳුනාගැනීම වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා තිබුණි. | පළාත් සභා මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වලට අදාලව කෙරීගෙන යන වැඩ ගිණුම තුල දක්වා ඇති රු.6,460,096 මුදල සකස් වී ඇත්තේ මදුරන්කුලිය සංචාරක තොරතුරු පහසුකම් මධ්‍යස්ථාන ව්‍යාපෘතියට අදාලව රු.3,771,807 සහ දුන්හිඳ ඇල්ල ව්‍යාපෘතියට අදාලව රු.2,724,289 ක මුදලේ එකතුවෙනි.<br>මදුරන්කුලිය සංචාරක තොරතුරු පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයට අදාල මුදල තවදුරටත් කෙරීගෙන යන වැඩ | අධිකාරියට අයිතිය නොපැවරෙන බැවින් දරන ලද වර්ෂවල වියදම් ලෙස හඳුනාගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | ගිණුම තුල දක්වා ඇත්තේ එය මේ දක්වා වැඩ අවසන් කර නොමැති බැවිනි. දුන්හිද යටිතල පහසුකම් දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.1,497,627 සහ රු 1,266,662 ක මුදලක් අදියර I යටතේ ලබා දී ඇත. මෙහි ඉතිරි මුදල් ඌව පළාත් සභාව මගින් ලබා දෙන බවට අධිකාරිය මගින් අදාල ප්‍රාදේශීය සභාවට දන්වා ඇත.නමුත් අදියර I යටතේ අවසන් කරන ලද වැඩ පිළිබඳ කිසිදු විස්තරයක් අධිකාරියේ මුල්‍ය අංශය වෙත මේ දක්වා ලබා දී නොමැත. ව්‍යාපෘතිය අවසන් බවට අදාල තහවුරු කිරීම් ලද විගස එම මුදල මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු ආදායම් පොලිය රු. 49,052,295 ක් වුවද එය රු.50,863,870 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා එම ආදායම රු.1,811,574ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වුණි. | මෙම පොලී ආදායම ගණනය කිරීම අදාල බැංකුව විසින් ලබා දුන් තොරතුරු පදනම්ව සිදුකර ඇති බව කාරුණිකව දැනුම් දෙමු. | ස්ථාවර තැන්පතු පොලී ආදායම් නිවැරදිව ගණනය කළ යුතුබව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ණයගැතියන් සඳහා බොල් හා අඩමාණ ණය වෙන්කිරීම් ප්‍රතිපත්තිය අනුව වෙන්කළ යුතු ප්‍රතිපාදනය රු. 36,919,352 ක් වුවද, අධිකාරියේ බදුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල වූ රු. 9,550,715 ක් ද එකී බොල් හා අඩමාන ණය ප්‍රතිපාදන වටිනාකමෙන් අඩුකර ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයට අදාල ඌනතාවය රු. 9,550,715 න් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වුණි. | බදු කරුවන්ගේ ලැබිය යුතු අගය සඳහා පවතින මූල්‍ය අවදානම තැන්පත් මුදල් මගින් යම් ප්‍රමාණයක් ආවරණය වන හෙයින් එසේ සිදු කර ඇත. | ණයගැතියන් සඳහා බොල් හා අඩමාණ ණය වෙන්කිරීම් අදාල ගිණුම් ප්‍රතිපත්තිය අනුව සිදු කළයුතු බව. |

| | | |
|---|---|---|
| (ඇ) දෙද්දුව ප්‍රදේශයේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දැරූ රු. 39,171,324 ක් වත්කම් ලෙස ප්‍රාග්ධනිත කිරීමටත් අත්තිකාරම් මුදල් බැංකුගත කිරීමෙන් ප්‍රාදේශීය ලේකම් ඉපයූ රු. 2,141,427 ක් ලැබිය යුතු පොලී ආදායම් ලෙස ගිණුම්ගත කිරීමටත් කටයුතු කර නොතිබුණි. | සැලසුම් හා සංවර්ධන අංශය මගින් තහවුරු කල අගය (2021/12/31 දිනට) මූල්‍ය අංශය විසින් ගිණුම්ගත කර ඇත. කෙසේවුවද, 2022 ගිණුම් වර්ෂය තුල අදාල නිවැරදි කිරීම සිදු කරනු ලැබේ. | අත්පත් කර ගැනීමේ වියදම් ප්‍රාග්ධනිත කිරීමටත් ඉපයූ පොලීය ආදායම් ලෙස ගිණුම්ගත කිරීමටත් කටයුතු කළයුතු බව. |
| (ඉ) කල්පිටිය සංවර්ධන ව්‍යාපෘතියට අදාලව රු.23,562,524 ක මුළු වත්කම් සහ එයට සමාන වටිනාකමකින් යුක්ත මුළු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම තීරුවක ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන පාර්ශවයන්ට එම ව්‍යාපෘතිය අධිකාරියේ පරිපාලිතයක් වශයෙන් වැරදි අදහසක් ඇතිවන පරිදි ඉදිරිපත් කර තිබුණි. | මෙය සත්‍ය වශයෙන් සංචාරක සංවර්ධන අධිකාරියේ පරිපාලිතයක් නොවුණු අතර කල්පිටිය ව්‍යාපෘතිය මත පදනම්ව ගිණුම්කරණ දෝෂයක් මත වෙනම කල්පිටිය ව්‍යාපෘතිය සඳහා ලෙජර් ගිණුම් කට්ටලයක් පවතී.ඉදිරියේදී මෙම ගනුදෙනු විශ්ලේෂණය කර ලෙජරය වසා දැමීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන පාර්ශවයන්ට නිවැරදි අදහසක් ඇතිවන පරිදි ඒවා ඉදිරිපත් කළ යුතු බව. |
| (ඊ) 2007, 2008, 2009 සහ 2011 වර්ෂයන්හි දැරූ රු.52,468,596 ක සංවර්ධන පිරිවැයට අදාළව ක්ෂය රු. 9,816,949 ක් අඩුවෙන්ද, 2010 වර්ෂයේ දැරූ රු.26,422,927 ක සංවර්ධන පිරිවැයට අදාළව ක්ෂය රු. 6,889,068 ක් වැඩියෙන්ද ගිණුම්ගත කිරීම හේතුවෙන් ඉදිරියට ගෙනා එකතු ආදායම් ගිණුම රු.2,927,881 න් අඩුවෙන් දක්වා තිබුණි. | මේ පිළිබඳ ගිණුම් වාර්තා පූර්ණ විශ්ලේෂණයට ලක්කර අදාල නිවැරදි කිරීම් සිදුකිරීමට එකගවෙමු. | සංවර්ධන පිරිවැයට අදාළව ක්ෂය නිවැරදිව ගිණුම්ගත කළයුතු බව. |

## 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) ලැබිය යුතු ගිණුම් | | | | | |
| (i) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 124,913,508 | 80,305,873 | 44,607,635 | 2022.03.23 වන දින ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ ඇතුලත් ලිපියක් සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙත අධිකාරිය විසින් යවා ඇති අතර එයින් රු.96,050,479 ක් මෙතෙක් ලැබී නොමැති ගොඩනැගිලි කුලී ආදායම වේ.මෙම ලිපියට අදාල ශේෂ සනාථ කිරීමේ පිළිතුරු ලිපියක් මේ වන තෙක් ලැබී නොමැත. අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් 2022 වර්ෂයේදී රු.13,162,548 ක් ලැබී ඇත. | ශේෂ සැසඳීමට පියවර ගතයුතු බව. |
| (i) ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය | 9,746,425 | 0 | 9,746,425 | සංචාරක හෝටල් කළමනාකරණ අයතනයයට 2022.03.23 ශේෂ සනාථ කර ගැනීමට ලිපියක් අධිකාරිය විසින් යවා ඇති අතර එයට පිළිතුරු ලිපියක් ලැබී නොමැත. | ශේෂ සැසඳීමට පියවර ගතයුතු බව. |
| (iii) ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය | 103,260 | 197,048 | 93,788 | ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයට 2022.03.23 ශේෂ සනාථ කර ගැනීමට ලිපියක් අධිකාරිය විසින් යවා ඇති අතර එයට පිළිතුරු ලිපියක් ලැබී නොමැත. | ශේෂ සැසඳීමට පියවර ගතයුතු බව. |
| (iv) සංචාරක සංවර්ධන අරමුදල | 2,803,815 | 4,732,903 | 1,929,088 | අපගේ ගිණුම් අනුව සංවර්ධන අරමුදල මගින් ලැබිය යුතු ශේෂයන් වන්නේ විගණන ගාස්තු, මුද්දර බදු,පරිපාලන ගාස්තු හා අගරු චෙක්පත් අගයකි.අරමුදලේ ගිණුම් හා සසදා බලා වෙනසක් ඇතොත් | ශේෂ සැසඳීමට පියවර ගතයුතු බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | මෙම වර්ෂයේ නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | |
| **(ආ)ගෙවිය යුතු ගිණුම්** | | | | | |
| (i) ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය | 6,512,810 | 5,774,778 | 738,032 | සංචාරක හෝටල් කළමනාකරණ අයතනයයට 2022.03.23 ශේෂ සනාථ කර ගැනීමට ලිපියක් අධිකාරිය විසින් යවා ඇති අතර එයට පිළිතුරු ලිපියක් ලැබී නොමැත. | ශේෂ සැසඳීමට පියවර ගතයුතු බව. |
| (ii) ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය | 0 | 31,997,283 | 31,997,283 | ඔබ සමග කරන ලද සාකච්ඡාවේදී සදහන් කරනු ලැබූ පරිදි ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය වෙත ගෙවිය යුතු මුදල ලෙස සදහන් රු.31,997,283 මුදල සංචාරක සංවර්ධන අරමුදලට අයත් එකක් බව සහ එය 2021වර්ෂයට අදාලව අරමුදලේ අවසන් ගිණුම් තුලද ඇතුලත් වී ඇත. | ශේෂ සැසඳීමට පියවර ගතයුතු බව. |
| (iii)සංචාරක සංවර්ධන අරමුදල | 703,607 | 470,844 | 232,763 | සංචාරක සංවර්ධන අරමුදල වෙත ගෙවිය යුතුව තිබූ රු.703,607 මුදල වන්නේ අයකැමි විසින් වැරදීමකින් සංවර්ධන අරමුදලට අදාල දෛනික මුදලක එකතුවක් අධිකාරියේ ගිණුමට තැන්පත් කර තිබූ අගයකි.එය චෙක්පත් අංක 256729 මගින් 2022.02.08 වන දින සංචාරක සංවර්ධන අරමුදල වෙත ගෙවා ඇත. | ශේෂ සැසඳීමට පියවර ගතයුතු බව. |
| (ඇ)වෙළඳ ණය ගැති යන් | 245,994,317 | 281,681,787 | 35,687,470 | මෙම වෙනස නිර්මාණය වී ඇත්තේ 2021 වර්ෂයට අදාල ණය ගැති ලැබීම් උප ලේජරයේ එකතුව ගණනය කිරීමේදීය.ලෙජර ගිණුම් සමග සසදා බලා උප ලෙජරය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.(වර්ෂ 01ට වඩා අඩු බැවින් බොල්ණය ගැලපීමේදී මෙය බලපෑමක් වී නොමැත.) | ශේෂ සැසඳීමට පියවර ගතයුතු බව. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | මුදල රු. (මිලියන) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ)ප්‍රාග්ධන සංචිතය | (243.7) | විස්තරාත්මක උපලේඛන | මෙම ශේෂ කපාහැරීමට සඳහා අනුමැතියට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත. | විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතු බව. |
| (ආ) ආයෝජන | 54.6 | ආයෝජන සහතික | මෙම ශේෂ කපාහැරීමට සඳහා අනුමැතියට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත. | උපයෝගී ලියවිලි ඉදිරිපත් කළ යුතු බව. |
| (ඇ)කල්පිටිය හිමිකම | 98.8 | කොටස් හිමියන්ගේ ලේඛන සහ බැංකු තැන්පතු විස්තර | කොටස් හිමියන්ගේ නාම ලේඛනය අමුණා ඇත. බැංකු තැන්පතු විස්තර සඳහා ගනුදෙනු ඇතුලත් මුදල් (ලේජරයේ) පොතේ මෑදු පිටපත් ලබා දිය හැකි බව කරුණාවෙන් සලකන්න. | උපයෝගී ලියවිලි ඉදිරිපත් කළ යුතු බව. |
| (ඇ)සංවර්ධන පිරිවැය | 215.2 | උපයෝගී ලියවිලි සහ විස්තරාත්මක උපලේඛන | ගිණුම් තුල ගනුදෙනු විශ්ලේශනය කර ව්‍යාපෘති ලිපිගොනු ආරම්භ කිරීමට පියවර ගනු ලැබේ. | උපයෝගී ලියවිලි ඉදිරිපත් කළ යුතු බව. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන්ගේ වටිනාකම රු.245,994,317 ක් වූ අතර 2022 සැප්තැම්බර් 05 දින වන විට ද එකදු ණයගැතියෙක්ගෙන් හෝ ශේෂ තහවුරු කිරීම් ලැබී නොතිබුණි. එදිනට ඉදිරිපත් කරන ලද වෙළඳ ණයගැති කාල විශ්ලේෂණයට අනුව වසර 3 සිට වසර 4ක් දක්වා පැරණි ණය ශේෂයේ එකතු වටිනාකම රු2 .9,861,932 ක් වූ අතර වසර 4ට වඩා පැරණි ණය ශේෂයේ | වසර 03 ට වඩා පැරණි ණයගැති ශේෂ සඳහා මුදල් ලැබීමේ සම්භාවිතාව අවම වන බැවින් මෙම ශේෂ පිළිබඳව නිවැරදිතාවය තහවුරු කල හැකිය. | හිඟ ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | එකතු වටිනාකම රු . 53,214,835ක් විය .ඒ අනුව වසර 3ට වැඩි හිඟහිටි ණයගැති ශේෂ එකතු වටිනාකම රු . 83,076,767ක්වූ නමුත් අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණවල පරස්පරතා හේතුවෙන් මෙකී වටිනාකම්වල නිවැරදිතාවය පිළිබඳව සෑහීමකට පත්වීමට නොහැකි විය. | | |
| (ආ) | ලැබිය යුතු තැන්පතු රු.9,439,982 ක ශේෂය තුළ 1989 සිට 2007 වර්ෂය දක්වා විදේශයන්හි කාර්යාල කුලී වෙනුවෙන් තැන්පත් කරන ලද රු.3,281,823 ක් නිරවුල් කරගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන දිනතෙක්ද කටයුතු කර නොතිබුණි. | ලිඛිත සාක්ෂි නොමැති මෙම අගයන් ලෙජරයෙන් කපාහැරීමට අධ්‍යක්ෂක මණ්ඩල තීරණය සඳහා යොමු කර ඇත. | මුදල් අමාත්‍යාංශ අනුමැතිය සහිතව ගිණුම් වලින් ඉවත් කිරීමට පියවර ගත යුතු බව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට තානායම් 37 න් අයවිය යුතු හිඟ කුලී ආදායමේ එකතු වටිනාකමරු. 26,364,027 ක් වූ අතර ඉන් වසර 4 කට වැඩි හිඟහිටි කුලී ආදායම රු. 10,622,282 ක් විය. මෙකී තානායම් 37න් 2009 වර්ෂයේදී වසර 10 කට බදු දෙන ලද ගල්ගමුව තානායමේ බදුකරු විසින් එය වෙනත් අයෙකුට පැවරීම නිසා 2021 වර්ෂයේදී අධිකාරිය විසින් නඩු පවරා තිබුණු අතර ඉහත හිඟ මුදලින් එම බදුකරුගෙන් අයවිය යුතු හිඟ මුදල රු. 2,670,873 ක් විය.කෙසේවුවද, 2021 දෙසැම්බර් 31 දිනට නිකේතන අංශය හා ගිණුම් අංශය අතර ලැබිය යුතු කුලී ආදායමේ රු. 1,172,098 ක වෙනසක් ද විය. | තානායම් 37න් තානායම් 28 ක පමණක් බදු ගිවිසුම් ක්‍රියාත්මක මට්ටමේ පවතින අතර එයින්ද මහියංගණය සහ නිකවැරටිය තානායම් ඉදිකිරීම් අවසන් නැත. දැනට ක්‍රියාත්මක නොවන තානායම් වල පෙර බදු කරුවන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා නිත්‍යානුකූල ක්‍රියාමාර්ග ගනු ලැබේ.<br>ගල්ගමුව තානායමේ බදු ගිවිසුම් 2019.04.08 දින අවසන් වූ අතර 2019 අප්‍රේල් මාසය වන විට රු.2,660,150 ක හිග මුදලක් කළමනාකරණය අංශයෙහි ගිණුම් තොරතුරු අනුව වාර්තා වෙයි.<br>හිග මුදල් අය කර ගැනීම සඳහා නඩු පැවරීමට ප්‍රථම කිහිප වතාවක් letter of demand යවා ඇති නමුත් බදු කරුගෙන් ඊට නිසි ප්‍රතිචාර ලැබී නොමැත. තානායමෙහි භුක්තිය අධිකාරිය වෙත 2022 මාර්තු මාසයේ නැවත භාරගෙන ඇති නමුත් නඩු කටයුතු තවම අවසන්ව නැත. | හිඟහිටි කුලී ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළයුතු බව සහ නිකේතන අංශය හා ගිණුම් අංශය අතර ලැබිය යුතු කුලී ආදායම් ශේෂ සැසඳිය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට වූ විවිධ ණයගැති ශේෂය රු.6,081,715 ක් විය. ඉන් වසර 4ට වඩා පැරණි විවිධ ණයගැති ශේෂ වටිනාකම රු.5,832,396ක් වූ අතර එය සියයට 96ක ප්‍රතිශතයක් විය. තවද,විවිධ ණයගැති වටිනාකම තුල රු.559,961ක නොසැසඳුණු ආරම්භක ශේෂයක් ද විය. | මෙම ශේෂයන් පිළිබද ගිණුම් තොරතුරු විශ්ලේෂණය කර අවශ්‍ය පියවර ගනු ලබන අතර ලිඛිත සාක්ෂි නොමැති ආරම්භක ශේෂය අදාල අනුමැතියට යටත්ව කපාහැරීමට පියවර ගනු ලැබේ. | අදාල අනුමැතින් සහිතව හිඟ ණයගැති ශේෂ කපාහැරිය යුතු බව සහ ශේෂ සැසඳීමට කටයුතු කළයුතු බව. |
| (ඉ) | විදේශීය සංචාරකයන් හට ප්‍රවාහන පහසුකම් ලබාදෙන ත්‍රී රෝද රථ රියදුරන් පුහුණු කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලෙස සංචාරක අමාත්‍යාංශයෙන් සිදුකරන ලද ඉල්ලීමකට අනුව සංචාරක සංවර්ධන අධිකාරිය මගින් ආරම්භ කරන ලද " ටුක් ටුක් වැඩසටහන" වෙනුවෙන් වැයවන මූල්‍යමය දායකත්වය අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කිරීමට එකග වී තිබුණු නමුත්, 2018 සහ 2019 වර්ෂයන්හි දරා තිබූ රු.13,227,648ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අය වී නොතිබුණි. | අමාත්‍යාංශය සමග සාකච්චා කර මේ පිළිබද අවසන් තීරණයක් මෙම මුල්‍ය වර්ෂය තුල ගනු ලැබේ. | අදාල මූල්‍යමය දායකත්වය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළයුතු බව. |
| (ඊ) | 2021 නොවැම්බර් 30 සිට දෙසැම්බර් 03 දින තෙක් ස්පාඤ්ඤයේ පැවති එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයේ වාර්ෂික රැස්වීම වෙනුවෙන් සංචාරක අමාත්‍යාංශ ලේකම් සහභාගි වී තිබුණු අතර ඒ වෙනුවෙන් අධිකාරිය විසින් දරන ලද පිරිවැය වූ රු. 1,398,426 ක් 2022 සැප්තැම්බර් 05 දින වන විටත් අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. | 2021 නොවැම්බර් මස 09 වන දින එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය විසින් සංවිධානයේ වාර්ෂික රැස්වීමට සහභාගී වන ලෙස සංචාරක අමාතංශයේ ලේකම්තුමාට හා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්තුමාට ලිඛිතව ආරාධනා කරන ලදී. ඒ අනුව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය හා ජනාධිපති ලේකම්තුමාගේ අනුමැතියට යටත්ව අප විසින් අවශ්‍ය කටයුතු කරන ලදී. මෙවැනි සංචාරයන් සඳහා මීට පෙර අවස්ථා කිහිපයකදීම අධිකාරිය විසින් පිරිවැය දරා ඇති අතර ඉදිරියේදී | සංචාරක අමාත්‍යාංශ ලේකම් වෙනුවෙන් දැරූ මූල්‍යමය දායකත්වය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළයුතු බව. |

මෙවැනි සංචාරයන් සඳහා අමාතංශයේ වැය ශීර්ෂයෙන් පියවා ගැනීමට අමාත්‍යාංශය දැන් කිරීමට කටයුතු කරමි.

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට වූ රු.153,739,503ක තැන්පතු හා වෙනත් ගෙවිය යුතු ශේෂය තුළ රු.4,275,041ක් වටිනා කාලපරිච්ඡේදය හඳුනා නොගත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් වටිනාකමක් විය. | 2021/12/31 දිනට ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් ගිණුමේ ශේෂය ඔබ ඉදිරිපත් කර ඇති ශේෂය සමග නොසැසදේ. එබැවින් ඔබ ශේෂය ලබාගත් ආකාරය පිළිබඳ තොරතුරු ලබා දෙනමෙන් ඉල්ලා සිටිමු. | තැන්පතු හා වෙනත් ගෙවිය යුතු ගිණුම තුළ ඇතුලත් ශේෂයන් පිළිබඳව විශ්ලේෂණයක් සිදුකළ යුතු බව. |
| (ආ) රු. 153,739,503 ක තැන්පතු සහ වෙනත් ගෙවිය යුතු ශේෂය තුල ඇතුලත් ඉදිරියට කරන ලද ගෙවීම් වටිනාකම වූ රු.24,620,808 කට අදාල ගනුදෙනුකරුවන් කවරේද යන්න සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් හඳුනාගැනීමට නොහැකි වී තිබුණි. තවද, එකී ශේෂයට කාල විශ්ලේෂණයක්ද ඉදිරිපත් කර නොතිබුණි. | මෙම අගයට අදාල කාල විශ්ලේශනය ඉදිරිපත් කරන අතර තැන්පත් කරුවන්ගෙන් තොරතුරු අධිකාරියට ලැබෙන තුරු ගනුදෙනු කරුවන්ගේ ලැයිස්තුවක් පිළියල කිරීම අපහසු වී ඇත. | තැන්පතු සහ වෙනත් ගෙවිය යුතු ශේෂය තුල ඇතුලත් ගනුදෙනුකරුවන් හඳුනාගැනීමට කටයුතු කළයුතු බව. |
| (ඇ) වර්ෂ 2010 සිට 2013 වර්ෂය දක්වා යුනිසෙෆ් (UNICEF)ආයතනය, නිවාඩු නිකේතන ජංගම ගිණුම, කුච්චවේලි සහ පාසිකුඩා වශයෙන් දක්වා ඇති ස්ථාන 4 කට අදාලව එකතුව රු. 2,180,326 ක් ගෙවිය යුතු මුදල් වශයෙන් පෙන්වා තිබුණද එම ගිණුම් හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන දිනය තෙක් කටයුතු කර නොතිබුණි. | ලිඛිත සාක්ෂි නොමැති මෙම ශේෂයත් ලේජරයෙන් ඉවත් කිරීමට (අදාල අනුමැතින්ට යටත්ව) පියවර ගනු ලැබේ. | විධිමත් අනුමැතීන් සහිතව ලේජරයෙන් ඉවත්කිරීමට පියවර ගතයුතු බව. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විදේශ අත්තිකාරම් නමින් වූ වසර 11ක් පැරණි රු. 333,694 ක අත්තිකාරම් ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන දින තෙක්ද පියවා නොතිබුණි. | ලිඛිත සාක්ෂි නොමැති මෙම ශේෂ ලේජරයෙන් කපා හැරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | විධිමත් අනුමැතීන් සහිතව ලේජරයෙන් ඉවත්කිරීමට පියවර ගතයුතු බව. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2005 අංක 38දරන සංචාරක කටයුතු පනත | | | |
| (i) පනතේ 6.1 (අ) සහ (ආ) වගන්ති | සංචාරක සංවර්ධනය සඳහා යෝජිත දිගුකාලීන ඉලක්ක සහ සිව් අවුරුදු සැලැස්මක් සකස්කර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වසරේ සිට සංචාරක කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම අමාත්‍යාංශය මඟින් ආරම්භ කරන ලදි .ඒ අනුව ආයතනික සැලසුම් සකස් කරන ලෙස ලේකම්තුමාගේ උපදේශය මෙන්ම අප ආයතනික සූදානම පැවතිණි .යෝජිත ප්‍රතිපත්තිය සකස් කිරීම අවසන් අදියරේ පවතින අතර , අමාත්‍යාංශය සමඟ සැලසුම සකස් කිරීමට අප කටයුතු කරන අතර ඒ අනුව දිගු කාලීන සැලැස්ම සහ ඉලක්ක අමාත්‍යතුමා වෙත ලබා දීමට බලාපොරොත්තු වෙමි . | සංචාරක සංවර්ධනය සඳහා දිගුකාලීන ඉලක්ක සහ සිව් අවුරුදු සැලැස්මක් සකස්කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ii) පනතේ 26(3) වගන්තිය | සංචාරක කලාප හඳුනාගෙන ප්‍රධාන සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය අරඹා තිබුණද, එම ප්‍රදේශ ඇතුළත කරගෙන යාහැකි සංචාරක කටයුතු, වාණිජ්‍යා හා වෙනත් කටයුතු නියම කරමින් නියෝග සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් සාදා නොතිබුණි. | මෙම කරුණට අදාල වන සැලසුම් සකස් කිරීමට 2018 වර්ෂයේ සිට ආරම්භ විය. එම වර්ෂයේ සිට නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සමග එක්ව ප්‍රධාන සැලසුම් සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර අදියර කිහිපයක් යටතේ එය සැලසුම් කර ඇත. ඒ අතරින් ඇල්ල සංචාරක කලාපය මේ වන විටත් ගැසට් කර තිබෙන අතර ආරුගම්බේ සහ නුවරඑළිය සංචාරක කලාප තුළ මෙම වසර අවසානයේදී (2022) සංචාරක සැලසුම් සකසා ගැසට් කිරීමට නියමිතව පවතී. කල්පිටිය සහ හික්කඩුව සංචාරක කලාපවල මේ වනවිටත් සංචාරක සැලසුම් කටයුතු සිදුවෙමින් පවතින අතර හඳුනාගත් අනිකුත් සංචාරක කලාප දෙවන අදියර යටතේ සලකා බලනු ලැබේ. | පනතේ විධි විධාන ප්‍රකාරව නියෝග සකස් කළ යුතු බව. |
| (iii) පනතේ 48 (4) වගන්තිය | අධිකාරියේ බලාත්මක ඒකකය මගින් 2018 අගෝස්තු සිට 2022 ජූලි දක්වා වූ කාලපරිච්ඡේදය තුළ හඳුනාගත් ලියාපදිංචි නොවූ ආයතන අතුරින් ස්ථාන 504 ක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යෝජිත වුවද, විගණිත දිනය වූ 2022 සැප්තැම්බර් 05 දින වන විටත් එපරිදි කටයුතු කර නොතිබුණි. | සංචාරක අමාත්‍යාංශයේ ලේකම්තුමාත් ආයතනයේ ඉහල කළමනාකාරිත්වයේත් එකඟතාවය මත සේවා සපයන්නන් හට සහයෝගය අවශ්‍ය අවස්ථාවේ ඔවුන් කඩාවැටීමට ඉඩ නොදී මෙම කර්මාන්තය ආරක්ෂා කර ගැනීමට නඩු පැවරීම් තාවකාලිකව නතර කිරීමට කටයුතු කර ඇත. එම සේවාදායකයන් රජය වෙත ගෙවනු ලබන බදු මුදලින් නඩත්තු වන ආයතනයක් ලෙස, සංචාරක කර්මාන්තයේ නිරත සේවාදායකයින් මුහුණ දුන් පාස්කු ප්‍රහාරය ,කොරෝන වසංගත තත්ත්වය, සහ ආර්ථික අර්බුදයෙන්ද ගොඩ ඒමට යම් කාලයක් අවශ්‍ය වන අතර එතෙක් ඔවුන් හා කර්මාන්තය | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණ සහිතව අධිකාරියේ බලාත්මක ඒකකය 2018 සිට 2022 දක්වා ලියාපදිංචි නොවූ ආයතන පිළිබඳ පරීක්ෂණ පැවැත් වූ බැවින් එයට සමගාමීව නීතිමය ක්‍රියාමාර්ග ද ගත යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | | රැකගැනීම අපගේ වගකීම වනු ඇත. | |
| (ආ) | 2018 දෙසැම්බර් 07 දිනැති අංක පීඊඩී 03/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2021 දෙසැම්බර් 15 දිනැති අංක පීඊඩී 03/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2021 මූල්‍ය වර්ෂය තුළදී අධිකාරිය අලාභ තත්ත්වයක් වාර්තා කර ඇතත් 2020 වර්ෂයට සාපේක්ෂව එම අලාභදායී බව අඩු කරගෙන ඇති ආයතනයක සේවකයන්හට රු. 5,000 ක ප්‍රසාද දීමනාවක් පමණක් ගෙවිය හැකි නමුත් සමාලෝචිත වර්ෂය තුළදී එක් සේවකයෙකුට රු. 13,500 ක් බැගින් වූ රු. 2,565,148 ක මුදලක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. | ආයතනයේ කළමනාකරණය සමග සාකච්ජා කර එම නිර්දේශය මත ඉදිරි පියවර ගනු ලැබේ. | ප්‍රසාද දීමනා ගෙවීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුගත විය යුතු බව. |
| (ඇ) | අංක 01/2021 සහ 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | (i) චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 5 ට අදාළව උපක්‍රමික සැලසුම් සකස් කළ යුතු වුවද අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය ආරම්භ වීමට පෙරාතුව එවැනි සැලසුමක් සකස් කර නොතිබුණු අතර 2022 ජනවාරි මාසයේ දී 2020 – 2022 කාලපරිච්ඡේදය සඳහා හෙවත් ගෙවීගිය වසර 2ක කාලයද ආවරණය වන පරිදි උපක්‍රමික සැලැස්මක් පිළියෙල කර තිබුණි. | 2017 2020 – කාල පරිච්ඡේදය සඳහා අධිකාරිය විසින් උපක්‍රමික සැලැස්මක් සකස් කර ප්‍රකාශයට පත් කරන ලදි .මෙම සැලැස්ම ක්‍රියාත්මක වෙමින් තිබූ අවධියේ 2019 , දී පාස්කු දින ත්‍රස්ත ප්‍රහාරයත් 2020 ,සිට බල පෑ Covid 19 තත්වයත් මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීම වෙත අභියෝග රැසක් පැන නගින ලදි .මේ වන විට 2022 සිට කර්මාන්තය එළඹ ඇති නව ආරම්භය සමඟ 2022-2025 කාලය සඳහා උපක්‍රමික සැලැස්මක් පිළියෙළ කර ඇත . | චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 5 ට අදාළව උපක්‍රමික සැලසුම් සකස් කළ යුතු බව. |

| | | |
|---|---|---|
| (ii) මුදල් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ගිණුම් ඉදිරිපත් කළ යුතු වුවද ,දින 186ක ප්‍රමාදයක් සහිතව 2022සැප්තැම්බර් 02දින ගිණුම් ඉදිරිපත් කර තිබුණි. | 2021 මුල්‍ය වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි මස 28 දින විගණන සහ කළමනාකරණ කමිටු අනුමැතියට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. 2022 වසරේ පළමු විගණන කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වූයේ 2022 අගෝස්තු 17වන දිනය. එම රැස්වීමට ඉදිරිපත් කර එම නිර්දේශය 2022 අගෝස්තු 30 දින මණ්ඩලීය දැනගැනීම පිණිස ඉදිරිපත් කර පෙර අනුමත කිරීම නැවත තහවුරු කර ඇති බව කාරුණිකව දැනුම්දෙමි. | චක්‍රලේඛයේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.101,319,843 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.118,817,905 ක ඌනතාවයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,498,062 වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ සංචාරක සංවර්ධන බද්ද රු.37,268,590 න් සහ වෙනත් ආදායම් රු. 40,718,097 න් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පරිසර හිතකාමී කඩ කාමර 20 ක්, එක් කුටියකට බංකු 02 ක්, ආරක්ෂිත වැටක් සහ නාම පුවරුවක් ඉදිකිරීමේ අරමුණ ඇතිව රු. 7,488,133 ක වැඩ වටිනාකමකින් 2017 පෙබරවාරි ආරම්භ කර 2017 දෙසැම්බර් 15 දින වන විට වැඩ අවසන් කිරීමට බලාපොරොත්තුවූ දුන්හිඳ ඇල්ල ව්‍යාපෘතිය 2018 ජනවාරි 22 දින වන විට රු.2,864,289 ක එකතු වියදමකින් කඩකාමර 10ක් සහ නාම පුවරුව පමණක් ඉදිකර වැඩ නවතා තිබුණි.කෙසේවුවද, 2021 වර්ෂයේ දී, දුන්හිඳ | පළමු අදියරේදී කඩ කාමර 5ක් සොරණාතොට ප්‍රාදේශීය සභාව මගින් ඉදිකරන ලදී. ඉතිරි කොටස ඉදිකිරීමට එම ප්‍රාදේශීය සභාව සතුව මුදල් නොමැති බව දන්වා සිටින ලදී. 2021/12/02 අධ්‍යක්ෂක මණ්ඩල ප්‍රතිකාවෙන් ලබාගත් තීන්දුව අනුව දෙවන අදියර වශයෙන් පරිසර හිතකාමී කඩකාමර 05ක් ඉදිකිරීමට කටයුතු කරන ලෙස ඌව පළාත් සංචාරක කාර්යංශයට දන්වා යවන ලදී. එවකට පැවති කොරෝනා වසංගතය සමග සංවරණ සීමා | ඇල්ල වැඩි සංචාරක ආකර්ෂණයක් ඇති ප්‍රදේශයක් බැවින් යටිතල පහසුකම් දියුණු කිරීම අධිකාරියේ ද වගකීමක් බව සහ සැලසුම් කළ පරිදි වැඩ අවසන් කිරීමට කටයුතු කළයුතු බව. |

| | | |
|---|---|---|
| ව්‍යාපෘතිය- අදියර II යටතේ තවත් කඩ කාමර 5 ක් රු. 2,350,000 ක වියදමකින් නිම කිරීමට අධිකාරිය තීරණය කර තිබුණ ද, මුල් සැලසුමේ වූ කාමර 5ක් ඉදිකිරීම අත්හැර තිබුණි. තවද, එක් කාමරයකට එවකට රු. 272,429 ක් වූ පිරිවැය වසර 4 ක ප්‍රමාදය හේතුවෙන් රු. 470,000 ක් දක්වා සියයට 72 ක් වර්ධනය වී තිබුණි. | පැනවීම, පළාත් හුදකලා කිරීම සහ මිල ගණන් ඉහළයාම නිසා කොන්ත්‍රාත් කරුවන් තෝරාගැනීම දුෂ්කර බව එම කාර්යාංශය දන්වා සිටින ලදී.<br>තවද, විටින්විට පළාත් හුදකලා කිරීමට ගන්නා ලද තීන්දුව අනුව පළාත් සභාව ප්‍රසම්පාදනය ප්‍රමාද කල අතර වෙන්කළ මුදල් ඒ සඳහා ප්‍රමාණවත් නොවන බව දන්වා සිටින ලදී. | |
| (ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ මදුරන්කුලියෙහි සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම (විවේකාංගනයක්) සඳහා 2016 ඔක්තෝම්බර් 27 දින වන විට ඉදිරිපත්කර තිබුණු බිල්පත්‍ර සඳහා අධිකාරිය රු. 6,771,807 ක මුදලක් වයඹ පළාත් සභාවට ගෙවා තිබුණි. කෙසේවුවද, රු. 5,846,556 ක ඉතිරි කළ වැඩ වෙනුවෙන් 2016 දෙසැම්බර් 22 දින වනවිට ඉදිරිපත් කළ බිල්පත් වල ඉංජිනේරු සහතික කිරීම් දෝෂ සහිත බව දක්වමින් අධිකාරිය විසින් එම මුදල් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිදහස් කර නොතිබුණු අතර ඒ හේතුවෙන්ම ව්‍යාපෘතියද අතරමග නවතා අක්‍රීය මට්ටමක පැවතුණු අතර මේ දක්වා සිදුකර තිබුණු ඉදිකිරීම් නිසිපරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් ජල කාන්දු වී දිරා යමින් විනාශ වී පැවතුණු බව භෞතික විගණන පරීක්ෂාවකදී හෙළිදරව් විය. | මදුරන්කුලිය තොරතුරු මධ්‍යස්ථානය කොළඹ පුත්තලම මාර්ගයේ අත්‍යවශ්‍ය කලාපයේ ඉදිරිකිරීමට පළාත් සභාව මුල්‍ය ප්‍රතිපාදන ලබා ගන්නා ලදී.<br>ඉදිකිරීම සඳහා සංචාරක සංවර්ධන අධිකාරිය, සංචාරක අමාත්‍යාංශය සහ වයඹ පළාත් සභාව මුදල් වියදම් කරන ලදී.<br>සියළු ප්‍රසම්පාදන කටයුතු වයඹ සංවර්ධන අධිකාරිය සතුව පැවතිනි.සංචාරක සංවර්ධන අධිකාරිය ගෙවා ඇති මුළු මුදල රු.මි. 6.8 ක් පමණ වේ. ව්‍යාපෘතිය පිලිබදව විගණන විමසීමක් තිබු අතර වයඹ පළාත් සභාව මගින් ලබා දුන් පිළිතුරු අමුණා ඇත. තවද,මේ වන විට පළාත් සභාව මගින් ජල කාන්දුව සඳහා ඉංජිනේරු උපදෙස් ලබා ගෙන පිළියම් යෙදීමටත් කටයුතු යොද ගෙන ඇත. මෙම ස්ථානය මහජන කටයුතු පවත්වාගෙන යාම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිම කර සුදුසු ආයෝජකයෙකු තෝරාගෙන ඇති බව දන්වා ඇත. | කල්පිටිය සංචාරක සංවර්ධන ප්‍රදේශයට ඇති එකම විවේකාංගනය මෙය බැවින් ව්‍යාපෘතියේ සාර්ථකත්වය පිළිබඳව අධිකාරිය සක්‍රිය දායකත්වයක් දැක්විය යුතු බව. |
| (ඇ) අළුත්නුවර ශ්‍රී දැඩිමුණ්ඩ දේවාල භූමියේ සනීපාරක්ෂක පද්ධතියක් ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේදී රු 12,775,030 .ක කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණු අතර 2020 ජූලි වන විට අධිකාරිය සබරගමුව පළාත් සභාවට රු . 10,799,405ක් ගෙවා තිබුණි . | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව නුවර දැඩිමුණ්ඩ දේවාලේ භූමියේ ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් මුදල රු.12,775,030 ක් විය. දේවාල භූමියේ ඉදිකළ සනීපාරක්ෂක පහසුකම් සම්බන්ධව විගණන විමසුමට දීරිස පිළිතුරක් සඹරගමුව පළාත මගින් ඒවා තිබුණි. මේ වන විට ගෙවා ඇති මුදල | සැලසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට උත්සාහ දැරිය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | කෙසේවුවද ,අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා නොගෙන ඉන් රු . 7,216,214ක් අතිරේක වැඩ සඳහා ගෙවා තිබුණු අතර ප්‍රමාණපත්‍ර අනුව එකඟ වූ නමුත් නිම නොකළ වැඩ වටිනාකම රු . 8,552,268ක් විය. | රු.12,205,711.16 වේ. අවසන් ගෙවීම් දක්වා සමස්ථ ගෙවීම ආවරණය වන පරිදි අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය 2022.06.23 දින ලබාගන්නා ලදී. මේ වන විට අදාල ස්ථානයේ වැඩ නිමකර මහජන පාවිච්චිය සඳහා විවෘත කිරීමට පළාත් සභාව කටයුතු කර ඇත. | |
| (ඇ) | පසුගිය වර්ෂයේ නවාතැන් සහ සංචාරක පහසුකම් සපයන ස්ථාන ලෙස අධිකාරියේ ලියාපදිංචි වූ ස්ථාන සංඛ්‍යාව 5378 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එම සංඛ්‍යාව 5872 ක් විය. ඒ අනුව අලුතින් ලියාපදිංචි වූ ස්ථාන සංඛ්‍යාව 494 කි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචිය අලුත් කළ ස්ථාන සංඛ්‍යාව 783 ක් පමණක් වූ බැවින් පෙර වර්ෂයේ ලියාපදිංචි කළ ස්ථාන 5378 න් ලියාපදිංචිය අලුත් කළ ස්ථාන 783 ක් අඩුකළ විට ස්ථාන 4595 ක්ම ලියාපදිංචිය අලුත්කර නොමැති බව පෙනේ. ඒ අනුව සංචාරක කටයුතුවල නිරතවන පුද්ගලයන් හෝ ආයතන නියාමනය ඉතා පහළ මට්ටමක පවතින බව පෙණුනි. | සමාලෝචිත වර්ෂය තුලදී ලියාපදිංචි වී ඇති මුළු නවාතැන් පහසුකම් ලබා දෙන ආයතන සංඛ්‍යාව 552ක් වන අතර සේවා පහසුකම් ලබාදෙන ආයතන සංඛ්‍යාව 194 කි . ඒ අනුව 2021 වර්ෂය තුලදී ආයතන 726ක් අලුතින් ලියාපදිංචිය ලබා ඇති අතර, 2021.12.31 දිනට ලියාපදිංචි වූ මුළු ආයතන සංඛ්‍යාව 5872ක් වේ. එසේම 2021 වසර තුළදී බලපත්‍ර අලුත් කරන ලද්දේ ආයතන 1454 කි .<br>ලියාපදිංචි ආයතන සංඛ්‍යාව යනු සංචාරක මණ්ඩලය බලපත්‍ර නිකුත් කිරීම ආරම්භ කල දින සිට ලියාපදිංචි වූ ආයතන සංඛ්‍යාවයි. එම ආයතනයන්හී මෙහෙයුම් නතර කිරීම, වසා දැමීම, පැවරීම හෝ අයිතිකරුවන් මියයාම ආදී කුමන හෝ හේතුවක් නිසා ක්‍රියාත්මක නොවන්නේ නම් ඒ බව අධිකාරිය වෙත විධිමත් පරිදී දැනුම් දීමකින් හෝ ක්ෂේත්‍ර පරීක්ෂණයකදී අනාවරණය වීමකින් මිස ලියාපදිංචිය අහෝසි කිරීමක් සිදු නොවේ. බලපත්‍ර අලුත් කිරීම සඳහා සිහි කැඳවීම් ලිපි 2996ක් යවා ඇත. තාවකාලික ලියාපදිංචිය මාස 6 ක් සඳහා සිදු කරන අතර එහිදී බලපත්‍රයක් නිකුත් කරනු නොලබයි.<br>පසුගිය කාලයේ ක්ෂේත්‍රය මුහුණ දුන් තත්ත්වය මත ඔවුන් වෙත අතදීමක් ලෙස 2020 හා 2021වර්ෂයන්හී ලියාපදිංචි අලුත් කිරීම සඳහා සහන කාලයක් ලබා දුන් අතර එතෙක් ලියාපදිංචිය අලුත් නොකලද මෙහෙයුම් කටයුතු කරගෙනයාමට | පනතේ විධිවිධාන ප්‍රකාරව නවාතැන් සහ සංචාරක පහසුකම් සපයන ස්ථාන නියාමනය කාර්යක්ෂම විය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | හා සුරාබදු බලපත්‍රය ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන ලදී. | |
| (ඉ) | 2018 අගෝස්තු සිට 2022 ජූලි දක්වා බලාත්මක ඒකකය මගින් සිදුකළ විමර්ශනයන්ට අනුව සංචාරක ව්‍යවසායන් හෝ සංචාරක සේවාවන් ලෙස ව්‍යාපාර කරගෙන යන ලියාපදිංචි නොකළ ආයතන 640 ක් හදුනාගෙන තිබුණු නමුත් ඉන් ආයතන 20 ක් පමණක් 2022 ජූලි 03 දින වන විට ලියාපදිංචි කර තිබුණි. ඒ අනුව, අවිධිමත්ව සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාර කරගෙන යන ආයතන බලාත්මක ඒකකය විසින් නියාමනය කිරීම ඉතා පහළ මට්ටමක පැවති බව පෙනේ. කළමනාකරණය විසින් මෙම ඒකකයේ කාර්යසාධනය පිළිබඳව ද ප්‍රමාණාත්මක ඇගයීමක් සිදුනොකර එම ඒකකයේ උපදේශක, විමර්ශන නිලධාරී සහ නීති උපදේශක වෙනුවෙන් දීමනා වශයෙන් පමණක් 2018 අගෝස්තු සිට 2022 ජූලි දක්වා එකතුව රු. 13,397,500 ක් ගෙවීමට කටයුතු කර තිබුණි. | නීතිය බලගැන්වීමේ ඒකකය 2018 වසර ආරම්භයේදී විමර්ෂණ නිලධාරීන් දෙදෙනෙකු මගින් කටයුතු ආරම්භ කල නමුත් පසුව මුළු රට තුලම විමර්ශන කටයුතු සිදු කිරීම එක් නිලධාරියෙකු මගින් සිදු කිරීමට සීමා විය . ඒ අනුව 2018-2022 කාලය තුලදි විමර්ෂණ කටයුතු ඒකක 640 ක් ආවරණය කරමින් සිදුකර ඇත.<br>ඒ අනුව 15 % කට අධික ආයතන ප්‍රමාණයක් මේ වන විටත් ලියාපදිංචිය ලබා ඇති අතර තවත් ආයතන 32ක ලියාපදිංචිය සිදු වෙමින් පවතී.<br>ආයතනයේ අයිතිය සනාථ කිරීමට නීතිමය ලියවිල්ලක් නොමැති වීම, බලයලත් ආයතනයක් විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මක් නොමැති වීම, ගිනි ආරක්ෂණ සහතිකය ලබා ගැනීමට අවශ්‍ය මුල්‍යාමය හැකියාව නොමැති වීම හා අවශ්‍ය පුහුණුව ලබා දීමට ඇති ප්‍රයෝගික අපහසුතා, පරිසර ආරක්ෂණ බලපත්‍ර කඩිනමින් ලබා ගැනීමට නොහැකි වීම හා අදාල ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමට වර්තමාන තත්ත්වය මත යම් කාලයක් ගත වීම හා ඒ සඳහා මුදල් ගෙවීමට ඇති නොහැකියාව .ආදී හේතුන් නිසා ලියාපදිංචිය සිදු කිරීමට පවතින නොහැකියාව හා රජයට බදු ගෙවීමට පොදුවේ සේවා සපයන්නන් තුල පවතින ඍනාත්මක ප්‍රතිචාරද මෙයට බලපානු ලබයි. | නීතිය බලගැන්වීමේ ඒකකය 2018 අගෝස්තු සිට 2022 ජූලි දක්වා ක්‍රියාත්මකව පැවති බැවින් නියාමන කටයුතු ද එයට සමගාමීව ක්‍රියාත්මක විය යුතු බව. |

| | | |
|---|---|---|
| (ඊ) නිලධාරීන් දෙදෙනෙකු විසින් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අධිකාරියට එරෙහිව පවරන ලද නඩු දෙකකට ආයතන සංග්‍රහයේ XXXIII වන පරිච්ඡේදයේ 5.1 සහ 5.2 වගන්ති ප්‍රකාරව නීතිපති උපදෙස් ලබා නොගෙන පෞද්ගලික නීතිඥ සේවාවන් ලබා ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව ඉහත නඩු දෙක සදහා පෞද්ගලික නීතිඥවරුන්ට සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට රු. 2,828,803 ක් ගෙවා තිබුණි. කෙසේවුවද, අංක COPE/09/1/2020 සහ 2021 දෙසැම්බර් 10 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අනුව සේවකයන් විසින් පවරන ලද නඩු වෙනුවෙන් විශාල මුදලක් වැය කරමින් පෞද්ගලික නීතිඥ සහාය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු නොකරන ලෙස අධිකාරියට දැනුම් දී තිබුණි. | මෙම නඩුකර දෙක සදහාම පෞද්ගලික නීතිඥ සේවාවන් ලබා ගෙන ඇත්තේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුවයි. .මෙලෙස පෞද්ගලික නීතිඥ සහය අධිකාරිය විසින් 2005 වර්ෂයේ සිටම අනුගමනය කර ඇති බව මේ සම්බන්ධ ගොනු පරික්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. මේ සම්බන්ධව නීතිපති උපදෙස් ලබාගැනීමට ලිපි කීපයක්ම යවා තිබෙන අතර නිසි උපදෙස් නියමිත නඩු දිනයට ප්‍රථම ලබාගැනීමට නොහැකිවී ඇත. COPE කමිටුවේ නිර්දේශයට අවනත වී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කිසිදු නව නඩුකරයක් සඳහා පෞද්ගලික නීතිඥ සේවය ලබානොගත් බවත් ඉහත කි නඩුකරයන් සඳහා දැනට සේවය ලබාගන්නා පෞද්ගලික නීතිඥයන් වෙනුවට නීතිපති දෙපාර්තමේන්තුවේ සහය පැතීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමුකර ඇති බවත් ,අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ලැබුණු වහාම ඒ අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. | සේවක කළමනාකරණ කටයුතු ඵලදායී අයුරින් ක්‍රියාත්මක වියයුතු බව සහ පෞද්ගලික නීතිඥයන්ගේ සේවය ලබාගැනීම තුළින් ආයතනයේ නීති වියදම් ඉහළ යාම පිළිබඳව අවධානය යොමුවිය යුතු බව. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පාසිකුඩා ජාතික නිවාඩු නිකේතන පරිශ්‍රය තුළ ස්ථාපිත හෝටල් හා ඊට සම්බන්ධ ආයතනවල මලද්‍රව්‍ය හා අපවහන ජලය පිරිසිදු කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අධිකාරිය 2011 ජුනි 18 දින පුද්ගලික සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණු අතර පද්ධතිය නඩත්තු කර පවත්වා ගෙන යාම, පරිශ්‍රයේ පිහිටි හෝටල් 14 න් ගාස්තු අයකර ගැනීම සහ ඉහත පුද්ගලික සමාගමට එසේ අයකරගත් මුදල් | මූල්‍ය උපදේශන ලබා ගැනීම සඳහා පුද්ගලික ආයතනයකට 2021 අප්‍රේල් මස 20 වන දින ප්‍රදාන ලිපිය නිකුත් කල අතර 2021 මැයි මස 10 වන ගිවිසුම් අත්සන් කර ඇත. නමුත් රටෙහි පැවති කොවිඩ් 19 වසංගතය හේතු කොට ගෙන ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කිරීම ප්‍රමාද විය. මුල් වරට ක්ෂේත්‍ර පරීක්ෂාවක් උපදේශන ආයතනයේ නිලධාරීන් සමග එක්ව 2021.07.04 සිට 06 දක්වා | කොවිඩ් වසංගත තත්වය ඇතිවීමට වසර 7 ට පෙර සිට හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කර නොමැති බැවින් ඒ පිළිබඳ දැඩි අවධානය යොමු විය යුතු බව. |

| | | |
|---|---|---|
| ගෙවීම අධිකාරියේ වගකීමක් විය. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පර්චස් 118 ක ඉඩම අධිකාරිය විසින් ලබා දී තිබුණි. කෙසේවුවද, 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දිනට හෝටල් 14 න් අයවිය යුතු මුදල රු. 299,461,325 ක් වූ අතර එම මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 2021 අප්‍රේල් 20 දින, මෙම පද්ධතිය අධිකාරියට පවරා ගැනීමේ හැකියාව පිළිබඳව මූල්‍ය උපදේශනය ලබා ගැනීම සඳහා රු. 1,644,750ක් වූ පිරිවැයකට පෞද්ගලික අංශයේ බද්ධ ව්‍යාපාරයක් තෝරාගෙන එයට ප්‍රදාන ලිපිය නිකුත්කර තිබුණු නමුත් ඒ සම්බන්ධ අවසාන නිගමනයක් ද 2022 සැප්තැම්බර් 05 දින වන විටත් ගෙන නොතිබුණි. | පවත්වන ලදී.<br>උපදේශන ආයතනය විසින් කෙටුම්පත් වාර්තාවන් 2021 අගෝස්තු 20 දින සිට වරින් වර ඉදිරිපත් කල අතර ඒ සම්බන්ධ සංනිවේදන කටයුතු එදින සිට ක්‍රියාත්මක වූ බව සඳහන් කරමි.<br>2013 වර්ෂයේ සිට අයවිය යුතු මුදල් වන රු.299,461,325 මුදල අයකර ගැනීම සඳහා සෑම මසකම ඉන්වොයිස් පත් යවන නමුත් ඔවුන් විසින් දිගින් දිගටම ගෙවීම් පැහැර හැර ඇත. 2022 ජනවාරි 19 දින සංචාරක අමාත්‍යාංශයේදී පවත්වන ලද සාකච්ජාවේදී මෙම ගෙවිය යුතු හිග මුදල් සම්බන්ධයෙන් හෝටල් කරුවන්ගේ සංගමයේ නියෝජිතයන් විසින් ප්‍රකාශ කලේ රටෙහි පවතින කොවිඩ් 19 වසංගතය සහ වර්තමානයේ පවතින ආර්ථික අර්බුද හේතු කොට ගෙන සංචාරකයින්ගේ පැමිණීම අඩු වීම් හේතුවෙන් මෙම හිග මුදල් මේ අවස්ථාවේදී ගෙවීමට නොහැකි බවත් අය කරන මුදල සාපේක්ෂව ඉතා ඉහල බවත්ය. | |
| (ආ) අධිකාරිය සතු ජාතික නිවාඩු නිකේතන 04 හි සමාලෝචිත වර්ෂය සඳහා වූ එකතු අලාභය රු.50,740,838ක් වූ අතර ඉකුත් වර්ෂයේ එකතු අලාභය රු.46,015,590ක් විය. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී නිකේතන හතරේ එකතු අලාභයෙහි සියයට 10ක වර්ධනයක් සිදුවී තිබුණ ද, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොතිබුණි. | අධිකාරිය සතු නිකේතන ආරම්භයේ සිටම ලාභ ලැබීමේ පරමාර්ථයෙන් තොරව පාඩු නොලබා දේශීය සංචාරකයින් සඳහා සුහද සේවාවක් සැපයීමේ අභිලාෂයෙන් පවත්වා ගෙන යනු ලබන අතර මිල ගණන්ද පවතින්නේ වියදම් පියවා ගැනීමේ ප්‍රමාණයට මදක් වැඩියෙනි. මේ හේතුවෙන් 2016 වසරේ සිට මේ දක්වා මිල ගණන් වල වැඩි කිරීමක් සිදු කර නොමැත. | පාඩු නොලබා සේවා පවත්වාගෙන යාම පිළිබඳව කළමනාකරණයේ ප්‍රමාණවත් අවධානයක් යොමු විය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | යාල සංචාරක සංවර්ධන කලාපයේ අක්කර 35 ක් 2014 වර්ෂයේදී සමාගම් 5 කට ද, තවත් අක්කර 16.8 ක් 2019 සහ 2020 වර්ෂවල දී සමාගම් 2 කට ද බදු දී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට බදු දුන් සමාගම් 7 න් සමාගම් 2 ක් පමණක් මෙහෙයුම් කටයුතුවල නිරතව තිබුණි. 2014 වර්ෂයේදී බදු ගත් සමාගමකට මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම වළක්වාලමින් මහාධිකරණයෙන් දුන් අතුරු තහනම් නියෝගයක් පිළිබඳව අධිකාරිය දැනුවත් කර හිඟ බදු මුදල් ගෙවා තිබියදී, 2020 මැයි මස අධිකාරිය විසින් "මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම" හේතුව ලෙස දක්වා එම බදු ගිවිසුම අවසන් කර තිබුණි. බදු ගිවිසුම අවසන් කිරීමට එරෙහිව බදුකරු විසින් කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා අධිකාරියට එරෙහිව වාරණ නියෝගයක් ලබා ගෙන තිබුණු නමුත් අධිකාරිය 2020 ඔක්තෝම්බර් 22 දින එම ඉඩම තවත් සමාගමකට බදු දීමට කටයුතු කර තිබුණි. එයට විරුද්ධව නැවත මුල් බදුකරු විසින් නඩුවක් ගොනු කර තිබුණු අතර මෙම සියලු නඩු සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබා නොගෙන පෞද්ගලික නීතිඥයන්ගේ සේවය ලබාගෙන 2021 වර්ෂයේ දී රු. 1,544,168 ක් නීති ගාස්තු වශයෙන්තිබුණි. | යාල සංචාරක කලාපය තුළ සකස් කර අවසන් කරන ලද සංචාරක සංවර්ධන ප්‍රධාන සැලැස්ම අනුව ඉඩම් අක්කර 07 බැගින් වූ ඉඩම් කට්ටි 07 ක ප්‍රමාණයක් ආයෝජකයන් වෙත ලබා දීමට හැකියාව පැවතුණි. ඒ අතරින් සමාගම් දෙකක මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී . තවත් ආයතනයක මෙහෙයුම් කටයුතු මේ වන විට අවසන් අදියරේ පවතිනු ලබයි .තවත් සමාගම් දෙකක ඉදිකිරීම් සිදු කිරීමේ මට්ටමෙහි පවතිනු ලැබේ. ප්‍රශ්නගත සමාගම වෙත ලබා දී තිබූ ඉඩම සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකළ බැවින් 2019 අගෝස්තු 14 වන දින (19/2097/106/032) දරන කැබිනට් තීරණයක් මත ගිවිසුම අහෝසි කර වෙනත් සමාගමකට ලබා දීමට කටයුතු කළ බැවින් ගැටලුකාරී තත්වයක් උද්ගත වී නීතිමය තත්වයක් කරා ගමන් කර ඇත.<br>මෙම කරුණු ප්‍රශ්න ගතකර ඇති අවස්ථාවේ මෙම සමාගම හිඟ බදු මුදල අධිකාරියට ගෙවීමට කටයුතු කර ඇත. ඒ පිළිබඳව නිසි පරිදි අදාළ අංශ දැනුවත් නොවීම මත මෙම නඩුකරය පවත්වාගෙන යාමට පදනම සකස් වී තිබේ. | බදුකරුවන් විසින් මෙහෙයුම් කටයුතු ඇරඹීම ප්‍රමාදවීම් සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කළයුතු බව සහ නීතිපති උපදෙස් ලබා නොගෙන පෞද්ගලික නීතිඥයන්ගේ සේවය ලබාගැනීම තුළින් ආයතනයේ නීති වියදම් ඉහළ යාම පිළිබඳව අවධානය යොමුවිය යුතු බව. |
| (ඈ) | අධිකාරිය සතු අනුරාධපුර ජාතික නිවාඩු නිකේතනය භෞතිකව පරීක්ෂා කිරීමේදී එහි පැරණි ගොඩනැගිල්ලේ වහල, මුලුතැන්ගෙය, ලොබි පරිශ්‍රය | දැනටමත් පැරණි ගොඩනැගිල්ලෙහි වහල ගලවා ඇති අතර එකී ගොඩනැගිල්ලේ ඉවත් කරන ලද භාවිතයට ගත හැකි කොටස් එම පරිශ්‍රයේම | ජාතික නිවාඩු නිකේතනයේ නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු විය යුතු බව. |

| | |
|---|---|
| සහ භෝජනාගාරයෙහි නඩත්තුව ඉතා පහළ මට්ටමක පැවතීම,වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියා විරහිතව පැවතීම, නාන කාමර උපාංග කැඩී බිඳී ගොස් පැවතීම, නිකේතනයේ අලංකරණයට බාධාවක් වන ලෙස භාවිතයට ගතහැකි සහ නොහැකි ද්‍රව්‍ය ගොඩගසා තිබීම ආදී අඩුපාඩු විය. | ගොඩ ගසා ඇත. මුල්තැන්ගෙය, ලොබි පරිශ්‍රය සහ භෝජනාගාරය නවීකරණයට ලක් කිරීමට වෙන් කර තබා තිබූ බවත් භෝජනාගාරය දැනටමත් නවීකරණය කටයුතු සිදු වෙමින් පවතින බවත් දන්වමි.තවද තැන තැන ගොඩගසා තිබූ අබිලි ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් දැනටමත් වෙන්දේසි කර නිකේතන භූමියෙන් ඉවත් කර ඇති බවද වැඩි දුරටත් දන්වා සිටිමි.<br>නව ගොඩනැගිල්ලේ වායු සමීකරණ යන්ත්‍ර සහ නාන කාමර උපාංග වල අඩුපාඩු මතු වූ අතර ඒවා නැවත යථා තත්වයට පත් කරන තුරු කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට ඇති මුදල් (retention money)ගෙවීම් අත් හිටුවා ඇත. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2011 සහ 2014 වර්ෂවලදි අධිකාරිය විසින් කුච්චවෙලි සංචාරක සංවර්ධන ව්‍යාපෘතින් සඳහා පවරා ගත් ඉඩම් අක්කර 510.086ක් වූ භූමි ප්‍රමාණයෙන් 2020 වර්ෂය වනවිට ඉඩම් අක්කර 35ක් පමණක් සමාගම් 2කට බදු දී තිබුණු අතර 2021 මැයි මාසයේදී අක්කර 14ක් තවත් සමාගමකට බදු දී තිබුණි. කෙසේවුවද, 2022 සැප්තැම්බර් 05 දින වන විටත් බදු දී තිබුණු සමාගම් 3න් එක් සමාගමක් පමණක් මෙහෙයුම් කටයුතුවල නිරතව තිබුණි. | මෙම කරුණට අදාළ කුච්චවෙලි ඉඩම් වසර 99කට බදු දීමට 1995 ජූලි මස 12වන දින කැබිනට් අනුමැතිය ලබා දෙන ලදී. එහි දී බදු මුදලකට යටත්ව එය සිදුකළ යුතු බවට කොන්දේසි පැනවුණි. මෙය සාමාන්‍ය බදු මුදලකට වඩා ඉහළ අගයක පැවතීම හේතුවෙන් ආයෝජන කටයුතු සඳහා ආයෝජකයන් ඉදිරිපත් වීම අවම විය. ආයෝජකයන් දෙදෙනෙකු එම කොන්දේසි වලට යටත්ව ඉදිරිපත් විය. වසර 99ක බදු ගිවිසුමෙහි බදු මුදල සාමාන්‍ය අගය ඉක්ම වීම හේතුවෙන් ආයෝජකයන් ඉදිරිපත් වීමේ ප්‍රවණතාව අවම වීම හේතු කර ගනිමින් 2010 | බදුකරුවන් විසින් මෙහෙයුම් කටයුතු ඇරඹීම ප්‍රමාදවීම් සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කළයුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | වර්ෂයේ දී ලබා ගත් ජනාධිපති චක්‍රලේඛය අනුව වසර 30 දක්වා බදු කාල සීමාව ලසු කරන ලෙස 2019 වර්ෂයේ දී සංචාරක අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් සංචාරක සංවර්ධන අධිකාරියට උපදෙස් දෙන ලදී. එමෙන්ම ආයෝජකයන් වෙත දැනට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණයන්හි සිදු කිරීමට නියමිතව ඇති ව්‍යාපෘති රටේ මේ වන විට පවතින ආර්ථික අර්බුදය හමුවේ අභියෝගයට පත්වී තිබෙන හෙයින් එම ව්‍යාපෘති 2023 වර්ෂයේ සිට සාර්ථකව අපේක්ෂිත ඉලක්ක කරා යොමු කිරීමට බලාපොරොත්තු වනු ලැබේ. | |
| (ආ) | සංචාරක කටයුතු සඳහා නිදහස් ප්‍රදාන වශයෙන් කල්පිටියේ දූපත් 12ක ඉඩම් අක්කර 2057.90ක භූමි ප්‍රමාණයක් 2010 සහ 2012 වර්ෂයන්වලදී අධිකාරියට ලැබී තිබුණි. එම දූපත් 12න් දූපත් 05කට අයත් ඉඩම් අක්කර 206.74 ක් පමණක් 2011 ,2010 සහ 2020 වර්ෂවලදී සමාගම් 03ට බදු දීමට කටයුතු කර තිබුණු නමුත් එම කිසිදු සමාගමක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි .බදු දී තිබුණු සමාගම්වලින් සමාගම් 2 ක පිළිවෙලින් රු.43,275,455 ක් සහ රු.9,063,277 ක් වශයෙන් වසර 3 සිට වසර 5 දක්වා බදු කුලිය හිඟව පැවතුණි. | කල්පිටිය ඉඩම් වලින් ඉප්පන්තිව් සහ වෙල්ලායි දූපත් සමූහය සමාගම් දෙකක් විසින් බදු ගිවිසුම් යටතේ ලබා ගන්නා ලදී. 2019 වර්ෂය වන විටත් ආයෝජන කටයුතු සඳහා ඉදිරිපත්වූයේ සමාගම් දෙකක් පමණි. එයට හේතුන් වූයේ ඒ වන විට පැවති යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීමත් එක් සමාගම විසින් සැලසුම් කළ වතුර මත ඉදිකරන ලද සංචාරක නිවහන් (Water Bungalow) සඳහා අනුමැතිය ලබා ගැනීමට නොහැකි වීමත් සහ අනෙක් සමාගම විසින් සැලසුම් කළ ව්‍යාපෘතියට අදාලව ප්‍රජාව අතර ඇති වූ ගැටලුකාරී තත්වයන්ය. පාස්කු ප්‍රහාර කාලසීමාවේ සහ කොවිඩ් කාල සීමාවේ දී සිදු කරන ලද සංචාරක ප්‍රවර්ධන කටයුතු ඇසුරෙන් ඉතිරි දූපත් 8න් 6ක් සඳහා ආයෝජකයන් සොයා ගැනීමට හැකිවිය. ඉතුරු දූපත් දෙක සඳහාද ආයෝජකයන් සොයා ගැනීමට කටයුතු කරමින් පවතී.<br>එක් සමාගමක් 2022 මාර්තු මස වන විට 2021 | ඉඩම් ඵලදායීව උපයෝජනය කිරීම සම්බන්ධයෙන් සහ බදුකරුවන් විසින් මෙහෙයුම් කටයුතු ඇරඹීම ප්‍රමාදවීම් සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කළයුතු බව |

| | | | |
|---|---|---|---|
| | | දෙසැම්බර් 31ක දක්වා තිබූ සියලුම හිඟ මුදල් ගෙවා අවසන් කර ඇත .ඉන් පසු කිසිදු ගෙවීමක් සිදු නොකළ බැවින් මේ වන විට මිලියන 1,355,740ක හිඟ මුදලක් තව දුරටත් පවතී. අනෙක් සමාගම විසින් ද 47,903,179.42 ක හිඟ මුදලක් මේ දක්වා පවත්වාගෙන එනු ලබන අතර මෙම ආයෝජකයා විසින් එම ව්‍යාපෘතිය තව දුරටත් කරගෙන යාමේ අභිලාශයක් නොපෙන්වන බැවින් ඒ පිළිබඳ ඉදිරියේ දී සාකච්ඡාවට ලක් කර තීරණයක් ගැනීමට නියමිතය. | |
| (ඇ) | අධිකාරිය සතු තානායම් 37 න් තානායම් 9 ක් වසර දෙකේ සිට වසර අටක් දක්වා කාලයක් බදු දී නොතිබීම හේතුවෙන් එකී දේපල ඌන උපයෝජිතව පැවතුණි. | ආනමඩුව,වීරකැටිය,නාලන්ද,රාගල සහ බත්තලුඔය තානායම් සඳහා ටෙන්ඩර් කැඳවන ලද අතර සුදුසු ආයෝජකයන් එම තානායම් බදු ගැනීම සඳහා ඉදිරිපත් වී නැත. | දේපල ඵලදායීව උපයෝජනය කිරීම සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කළයුතු බව. |
| (ඈ) | ගාල්ල දිස්ත්‍රික් ලේකම්ගේ අංක ඩීපීඑස්/එල්එන්ඩී/03/බීඒඑන්/පොදු සහ 2017 ජුනි 20 දිනැති ලිපිය පරිදි 2017 වර්ෂය වන විට රු. 173,159,909 ක් ගෙවා දෙද්දුව සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කර තිබුණ ද, 2022 සැප්තැම්බර් 05 දින වනවිටත් එහි සංචාරක සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි. | දෙද්දුව සංචාරක සංවර්ධන කලාපය 2004 පෙබරවාරි 10 වන දින බෙන්තොට දිස්ත්‍රික් ලේකම් මඟින් ප්‍රදේශීය ලේකම්ගේ අනුමැතිය මත සංචාරක සංවර්ධන අධිකාරිය වෙත වන්දි මුදලක් ගෙවා අත්පත් කර ගන්නා ලදී. මේ වන විට මෙම කලාපය තුළ සීමා මායිම් ලකුණු කරමින් මායිම් වැටවල් ඉදි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එක් ආයෝජකයෙකු සංචාරක ව්‍යාපෘති සිදු කිරීම සඳහා ඉදිරිපත් වන ලදී. එම ආයෝජන ව්‍යාපෘතිය සම්මත කිරීමෙන් අනතුරුව සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ආයෝජක පාර්ශවයට දේශීය මූල්‍ය ආයතනයක ඇමරිකානු | දේපල ඵලදායී උපයෝජනය සම්බන්ධයෙන් කළමනාකරණයේ නිසි අවධානය යොමු විය යුතු බව. |

| | | |
|---|---|---|
| | ඩොලර් මිලියන 500ක ආයෝජනයක් සිදු කළ යුතු බවට නියම කරනු ලැබූ නමුත් ලබා දුන් කාලසීමාව තුළ ආයෝජකයා විසින් එම ගෙවීම සිදු නොකළ අතර ඒ පිළිබඳව සංචාරක අමාත්‍යාංශ නිලධාරීන් සහ අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාල නිලධාරීන් සමඟ සිදුකළ සාකච්ඡාවෙන් පසුව එම ආයෝජන ව්‍යාපෘතිය අවලංගු කිරීමට තීරණය විය. 2020/2021 වර්ෂයේ දී ජනාධිපති නියමය පරිදි මෙම භූමිය වගා කටයුතු වලට සුදුසු නුසුදුසු බව පරීක්ෂාවට යුද හමුදාවට ලබා දීම මත මෙමවර්ෂ වලදී දෙද්දූව සංචාරක කලාපයේ සංවර්ධනකටයුතු යම්තාක් දුරකට අඩාල වීමක් ද සිදු විය. ඉදිරියේදී මෙම සංචාරක කලාපය සඳහා ප්‍රධාන සැලසුම් (Master Plan) සකස් කිරීමටද කටයුතු සූදානම් වෙමින් පවතී. | |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ දී අධිකාරිය, ප්‍රවර්ධන කාර්යාංශය, හෝටල් පාසල සහ සම්මුති කාර්යාංශය සඳහා කණ්ඩායම් වෛද්‍ය රක්ෂණාවරණයක් (Group Policy) සීමිත තරඟකාරී ලංසු කැඳවීම මඟින් තෝරාගත් ශ්‍රී ලංකා රක්ෂණ සමාගමෙන් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා ආයතන හතරෙන් රු.50,469,628 ක මුදලක් රක්ෂණ සමාගමට ගෙවා තිබුණි. පසුකාලීනව අධිකාරියේ සභාපතිනිය සහ අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් තැරව්කාර සමාගමක් නම් කර එම සමාගමට ඉහත ගනුදෙනුවට අදාල කොමිස් මුදල් ගෙවන ලෙසත් එම | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් අදාළ වර්ෂය සඳහා නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ඍජු ක්‍රමය යටතේ රක්ෂණ සේවා සපයන ආයතනයක් තෝරා ගන්නා ලදී.<br>එවකට සිටි සංචාරක විෂයභාර අමාත්‍යතුමන් විසින් අධිකාරියේ අනුදැනුමකින් තොරව රක්ෂණ ආයතනය විසින් රක්ෂණ නියෝජිතයෙකු වෙත යම් කොමිස් මුදලක් ගෙවීමට කටයුතු කරන බව දැනුවත්වී ඒ පිළිබඳව අධිකාරියේ කළමනාකාරිත්වයට අනාවරණය කරන ලදි .ඉන්පසු | ගනුදෙනු විනිවිදභාවයකින් යුක්තව සිදුවිය යුතු බව. |

| | | |
|---|---|---|
| මුදල කුවේට් හි සමාජ සත්කාරක වැඩසටහනකට යෙදවීම සඳහා බවත් රක්ෂණ සමාගමට දැනුම් දී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රතිලාභ ලබාගත් සේවකයන් කිසිවෙකුට තැරව්කාර සමාගමක සේවය ලැබී නොතිබුණු අතර කිසිදු සමාජ සත්කාරක වැඩසටහනකට මෙම මුදල් යොදවා ද නොතිබුණු නමුත් රක්ෂණ සමාගමෙන් 2021 අප්‍රේල් සහ මැයි මාසයන්හිදී රු.4,798,290 ක කොමිස් මුදලක් එම තැරව්කාර සමාගමට ගෙවා තිබුණි. ඒ අනුව ඍජුව සිදුවූ රක්ෂණ ගනුදෙනුවක් සඳහා කොමිස් මුදල් ඉල්ලා සිටීම විගණනයේ දී සැකකටයුතු ගනුදෙනුවක් විය. | අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි කුවේට් රටේහි අතරමං වූ ශ්‍රී ලාංකික විදෙස් ශ්‍රමික කාන්තාවන් පිරිසක් ආපසු ගෙන්වා ගැනීමේ මෙහෙයුමක් සඳහා අදාළ රක්ෂණ ආයතනයේ සභාපතිවරයාගෙන් ඉල්ලීමක් සිදුකොට ඇති අතර එම රක්ෂණ ආයතනය විසින් අමාත්‍යතුමන්හට පවසා ඇත්තේ අදාළ අරමුදල් මාරු කිරීම නියෝජිත ආයතනයක් හරහා පමණක් සිදුකල හැකි බවත්, ඒ ප්‍රකාරව අමාත්‍යතුමන් විසින් තැරව්කාර සමාගමක් නම් කර ඇත .එම මුදල උක්ත පරිදි උතුම් සමාජයීය කටයුත්තක් සඳහා යෙදවීමට හිටපු අමාත්‍යතුමන් විසින් නම් කල තැරව්කාර සමාගම වෙත මාරු කිරීම සඳහා අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි එවකට සිටි සභාපතිනිය සහ අධ්‍යක්ෂ ජනරාල්තුමිය විසින් ලිඛිත ඉල්ලීමක් පමණක් සිදුකොට ඇත . ඒ හැරුණු කොට අදාළ නිරීක්ෂණයේ සඳහන් කොමිස් මුදල සම්බන්ධව වෙන කිසිදු තොරතුරක් හෝ විස්තරයක් අධිකාරිය නොදන්නා අතර හිටපු අමාත්‍යවරයා සහ රක්‍ෂණ සමාගමේ සභාපතිවරයා අතර මෙම සාකච්ඡා සිදුවී ඇති බැවින් ඒ පිළිබඳව වැඩිදුර තොරතුරු අධිකාරිය නොදන්නා බව අවධාරණය කර සිටිමු. | |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාපතිනියගේ කාර්යාලයට අනුයුක්ත කාර්යාල කාර්ය සහායක විසින් 2020 වර්ෂයේ අවස්ථා කිහිපයකදී ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයෙන් එකතුව රු1,072,102.ක ටෝනර් සභාපතිනියගේ අත්සන් සහිත | ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයෙන් සභාපති කාර්යාලයේ රාජකාරී කටයුතු සඳහා ලබාගත් ටෝනර් හෝ අනෙකුත් ලබා ගන්නා ලිපි ද්‍රව්‍ය අධිකාරිය සතු වත්කම් නොවන බැවින් අධිකාරියේ | ආයතනයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ශක්තිමත් විය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩ ඉල්ලුම් පත්‍ර මගින් ලබාගෙන තිබුණු නමුත් ඒවා අධිකාරියේ ගබඩාවට ලැබී නොතිබුණි. එකී භාණ්ඩ ඉල්ලීම පිළිබඳව හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් අධිකාරියේ සභාපතිනියට සහ අධ්‍යක්ෂ ජනරාල්වරියට විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් දැනුවත් කර තිබුණ ද, ඒ පිළිබඳව කිසිදු පරීක්ෂණයක් 2022 සැප්තැම්බර් 05 දින වන විටත් සිදුකර නොතිබුණි.එසේ තිබියදී, 2021 අගෝස්තු 05දින එකී කාර්යාල කාර්ය සහායක සහ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ කාර්යාලයට අනුයුක්ත කාර්යාල කාර්ය සහායක විසින් රු.1,234,540 ක් වටිනා ඡායා පිටපත් සහ ටෝනර් ගබඩාවෙන් සොරාගෙන තිබුණු අතර ඔවුන්ගේ සේවය අත්හිටුවීමට කටයුතු කළ ද, 2022 අගෝස්තු 24 දින නිකේතන කළමනාකරණ අංශයේ තිබුණු අලුතින් මිලදී ගත් රු.198,500 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් ද අස්ථානගත වී තිබුණි.ඒ අනුව, මුලින් ලද පැමිණිලි සම්බන්ධයෙන් කළමනාකරණය සක්‍රීයව මැදිහත් නොවීම සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි දුර්වලතාවය හේතුවෙන් දිගින් දිගටම වංචා සිදුවන පරිසරයක් අධිකාරිය තුළ නිර්මාණය වී තිබුණු බව නිරීක්ෂණය කෙරේ. | ගබඩාවට ලබා ගැනීමේ ක්‍රමවේදයක් නොතිබිණි. සභාපති කාර්යාලයට අනුයුක්ත කාර්යාල කාර්ය සහායක සහ අධ්‍යක්‍ෂ ජනරාල් කාර්යාලයට අනුයුක්ත කාර්යාල කාර්ය සහායක විසින් සිදු කළ සොරකමක් සම්බන්ධව 2021 අගෝස්තු 11 දින කොල්ලුපිටිය පොලිසියට පැමිණිලි කරන ලදුව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 21/14/200මගින් නඩු පවරන ලදී .ඒ අනුව, දැනට නඩු වාර 02ක් පවත්වා ඇත .තවද, අධිකාරියේ ඉල්ලීම පරිදි අමාත්‍යාංශ ලේකම්තුමාගේ මැදිහත්වීමෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරීන් විසින් මූලික විමර්ශනයක් සිදු කර අදාළ නිර්දේශ සහිත වාර්තාව අධිකාරියට 2022 අගෝස්තු මස ලබා දී ඇත .ඉදිරියේදී එම වාර්තාව අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇති අතර උක්ත චෝදනාවට ලක් වූ සේවකයන් දෙදෙනාට චෝදනා පත්‍ර නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඉදිරි විනය ක්‍රියාමාර්ගයන් ගැනීමට නියමිතවේ . උක්ත සිද්ධීන් සම්බන්ධයෙන් අධිකාරී කළමනාකාරිත්වය විසින් පොදු නීතිමය සහ විනය ක්‍රියාමාර්ගයන් කඩිනමින් ගෙන ඇති බව පෙන්වා දෙන අතර එබැවින් "මුලින් ලද පැමිණිලි සම්බන්ධයෙන් කලමනාකරණය සක්‍රීයව මැදිහත් නොවීම "යන නිරීක්ෂණය සම්බන්ධයෙන් එකඟවිය නොහැක. | |
| (ආ) | බෙන්තොට නිවාඩු නිකේතනයේ ජල සැපයුම් පද්ධතිය අළුත්වැඩියා කිරීමට අදාළව ලංසු කැඳවීමේදී, කොන්ත්‍රාත්කරුවන්ට ඉක්ටැඩ් ආයතනය විසින් සපුරාලිය යුතු | උක්ත ප්‍රසම්පාදනයට අදාලව 2020.08.13 වන දින, 2020.12.10 වන දින හා 2021.03.24 යන දිනයන් හිදී | ලංසු කැඳවීමේදී දැනුම්දුන් නිර්ණායකයන්ට අනුගත විය යුතු බව. |

| | | |
|---|---|---|
| සුදුසුකම් තිබිය යුතු බව දන්වා තිබුණද, රු.65,510,000 ක කොන්ත්‍රාත්තුවකට අදාල සැපයුම්කරු එම සුදුසුකම් රහිත අයෙක් වුවද ඔහුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු කර තිබුණි. | ප්‍රසම්පාදන දැන්වීම් තුනක් පල කර තිබුණි. ප්‍රථමවර ලංසු කැඳවීමේදී ලංසු ද්විත්වයක් ලැබී තිබූ අතර තාක්ෂණික ඇගයීමේදී ඔවුන්ගේ ලංසු ප්‍රතික්ෂේප වී තිබුණි. දෙවන වර ලංසු කැඳවීමේදී එක් ලංසුවක් පමණක් ලැබී තිබූ අතර එම ලංසුවද ප්‍රතික්ෂේප වී තිබුණි.ඒ අනුව දෙවනවර ලංසු ඇගයීමේදී උපදේශක ආයතනය වන ඉංජිනේරුමය කාරනයන් පිලිබඳව මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB)මගින් එවන ලද 2021.01.12 වන දිනැති වාර්තාවේ නිර්දේශ මත පදනම්ව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නැවතත් ලංසු කැඳවීමට නිර්දේශ කර තිබුණි. එහිදී උපදේශක ආයතනය විසින් සුදුසුකම් නිර්නායකයන් වෙනස් කිරීමකට ලක් කොට 2021.03.02 වන දින ලංසු ලේඛන තෙවනවර ප්‍රසම්පාදනය සඳහා ලබා දී තිබුණි. ඒ අනුව පෙර පැවති නිර්ණායකයන්ට අමතර තවත් නිර්ණායකයක් පහත පරිදි ඇතුලත් කර තිබුණි. | |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---------------------------

| විගණන නිරීක්ෂණය<br>------------------------ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>---------------------------- | නිර්දේශය<br>----------------- |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රාග්ධන වියදම් තුළ ඇති ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් 40ක ඇතුළත් උප ක්‍රියාකාරකම් 218කින් කිසිදු මූල්‍ය ප්‍රගතියක් අත්කර නොගත් ක්‍රියාකාරකම් 155ක් පැවතුණි .එය ප්‍රතිශතයක් ලෙස සියයට 71කි. තථ්‍ය කාර්යසාධන වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ක්‍රියාකාරී | 2021 වසරේ රටේ පැවති Covid වාතාවරණ තත්වය හමුවේ සැලසුම් කළ ක්‍රියාකාරකම් බොහොමයක් ක්‍රියාශීලීව ඉදිරියට ගෙන යා හැකි තත්වයක් නොපැවතුණු බැවින් 2021 වසර සඳහා සැලසුම් කළ කාර්යයන් බහුතරයක් 2022 වසර සැලැස්මට ඇතුළත් කරන ලදී. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඵලදායී කළමනාකරණ මෙවලමක් ලෙස භාවිතා කළ යුතු බව. |

සැලැස්මේ භෞතික ප්‍රගතිය විශ්ලේෂණය කිරීමට නොහැකි වුණි.

එහෙයින් මූල්‍යමය ප්‍රගතිය අඩු අගයක් පෙන්නුම් කරනු ලබයි. එහෙත් කාර්යසාධනය මූල්‍යමය ප්‍රගතියට වඩා ඉහළ අගයක් පවතින අතර එයට ප්‍රධාන හේතු විය හැක්කේ සමහර උප ක්‍රියාකාරකම් සඳහා මූල්‍යමය වියදමක් නොපැවතීමයි. කෙසේ වෙතත් රටේ පැවැති Covid වාතාවරණය යටතේ සහ සේවකයන් සේවා ස්ථානයට පැමිණීම සීමා කිරීමත් අභ්‍යන්තර ගමනාගමන කටයුතු තහනම් කිරීමත් හේතුවෙන් 2021වසරේ ක්‍රියාශීලී සැලැස්ම භෞතික මෙන්ම මූල්‍යමය ප්‍රගතිය සාපේක්ෂව අඩු වර්ෂයක් බවට පත්විය.